## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss - 2022)

(10 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 10 ශ්‍රේණිය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| 10 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | |
| 1. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.1 නාට්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරයි. | ▪ නාට්‍යයක ස්වභාවය ගවේෂණය කරයි.<br>▪ නාට්‍ය පෙළක ස්වරූපය නිරීක්ෂණ කරයි.<br>▪ කතාන්දරයක නාට්‍යෝචිත අවස්ථා තෝරා ගනියි<br>▪ කතාන්දරයක හා නාට්‍යයක සමාන අසමානතා පෙන්වා දෙයි. | ▪ කතාන්දරයක ලක්ෂණ<br>▪ නාට්‍යයක ලක්ෂණ<br>▪ කතාන්දරයක හා නාට්‍යයක සමාන අසමානතා | 1.1 නාට්‍යය හඳුනා ගනිමු. (සිද්ධාන්ත) | 02 |
| | 1.2 නාට්‍ය කලාව අනෙකුත් කලාවන්ගෙන් වෙනස් වන්නේ කෙසේ දැයි සාකච්ඡා කරයි. | ▪ දෘශ්‍ය කලා සහ ප්‍රාසංගික කලා මාධ්‍යයන් විස්තර කරයි.<br>▪ නාට්‍ය කලාවේ සුවිශේෂතා නම් කරයි.<br>▪ වේදිකා නාට්‍යයක් සඳහා භාවිත වන විවිධ කලා ප්‍රභේද නම් කරයි | ▪ දෘෂ්‍ය හා ප්‍රාසාංගික කලා මාධ්‍යයන්ට අදාළ ආවේණික ලක්ෂණ<br>▪ එම කලා මාධ්‍යයන් අතර සමාන අසමානතා<br>▪ විවිධ කලා නිර්මාණ ශිල්පීන් පිළිබඳ තොරතුරු | 1.2 දෘශ්‍ය සහ ප්‍රාසංගික කලා මාධ්‍යයන් ගෙන් නාට්‍යය වෙන්කර හඳුනාගනිමු. (සිද්ධාන්ත) | 01 |
| | 1.3 නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය යන ප්‍රභේදයන්හි වෙනස පැහැදිලි කරයි. | ▪ නෘත්ත හා නෘත්‍ය යන්න පැහැදිලි කරයි.<br>▪ නෘත්ත හා නෘත්‍යයෙන් නාට්‍යය වෙනස් වන ආකාරය සාකච්ඡා කරයි.<br>▪ නෘත්ත හා නෘත්‍ය නිරූපණය වන ක්‍රියාකාරකම්හි නිරත වෙයි.<br>▪ නර්තනය යනු නෘත්ත හා නෘත්‍යයෙහි සංකලනයක් බව ප්‍රකාශ කරයි. | ▪ ඉඟියකට අදාළ ව කතාවක් නිර්මාණය කිරීම.<br>▪ සුදුසු පරිදි අවකාශ භාවිත කිරීම.<br>▪ තාලාන්විත / අර්ථ ප්‍රකාශන සහිත ව ඉදිරිපත් කිරීම. | 1.3 නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය අතර වෙනස දකිමු. (සිද්ධාන්ත) | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.1 විවිධ චලන අභ්‍යාසයන්හි යෙදෙයි. | ▪ ස්වාභාවික චලන, නිර්මිත චලන හා තාලානුකූල චලන හඳුනා ගැනීම.<br>▪ ස්වාභාවික චලන සහ නිර්මිත චලන අතර වෙනස හඳුනා ගැනීම.<br>▪ තාලානුකූල චලනයක් නිර්මාණය කරයි.<br>▪ ස්වාභාවික චලන, නිර්මිත චලන සහ තාලානුකූල චලන ප්‍රායෝගික ව අවබෝධ කර ගැනීම. | ▪ ස්වභාවික, නිර්මිත, තාලානුකූල චලන අර්ථ ගැන්වීම.<br>▪ රූපණ කාර්යය සඳහා චලන භාවිතය.<br>▪ නිර්මිත චලන සහ තාලානුකූල චලන මඟින් අදහස් ප්‍රකාශ කිරීම. | 2.1 ස්වාභාවික චලන, නිර්මිත චලන හා තාලානුකූල චලනයන්හි යෙදීම. (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | 02 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි. | 3.2 නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් නාට්‍යෝචිත පරිදි සංවාද භාවිත කරයි. | ▪ නාට්‍යධර්මී හා ලෝක ධර්මී නාට්‍ය ගීත ශ්‍රවණය කරයි<br>▪ දික්තල - කාලගෝල නාට්‍යයේ එන නාඩගම් රාග තාල ගායනා කරයි.<br>▪ ගීත රස විඳියි.<br>▪ ගායනයක අඩංගු විය යුතු ගුණාංග පුහුණු වෙයි.<br>▪ විවධ ශෛලීන්ට අයත් ගීත ගයමින් රඟයි. | ▪ නාඩගම් රාග තාල අනුව ගායනය<br>▪ නාට්‍යානුසාරී ව ගායනයෙහි යෙදීමේ හැකියාව සංවර්ධනය.<br>▪ නාට්‍ය ගීත ගායනයක තිබිය යුතු ගුණාංග. | 3.2.3 ගී ගයමින් අපි රඟමු. (සිද්ධාන්ත හා ප්‍රායෝගික) | 03 |
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති නාට්‍යමය ලක්ෂණ හඳුනා ගනියි. | ▪ දේශීය ශාන්තිකර්ම අතරේ පහතරට ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ බහුල ව දක්නට ලැබෙන බව හඳුනාගනියි.<br>▪ රටයකුම, සන්නියකුම, සූනියම් යාගය යන ශාන්තිකර්මවල ඇති නම් කරන ලද නාට්‍යමය පෙළපාළිවල නාට්‍යමය ලක්ෂණ පැහැදිළි කරයි.<br>▪ ඉහත ශාන්තිකර්ම නැරඹීමට කැමැත්ත ප්‍රකාශ කරයි. | ▪ දේශීය ශාන්තිකර්ම අතරේ පහතරට ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ<br>▪ රටයකුම (නානු මුරේ), සන්නියකුම (අවතාර ත්‍රිත්වය), සූනියම් යාගය (වඩිග පටුන) යන ශාන්තිකර්මවල ඇති නම් කරන ලද පෙළපාළිවල නාට්‍යමය ලක්ෂණ. | 4.1 ශාන්ති කර්ම නරඹමු. නාට්‍යමය ලක්ෂණ සොයමු. (සිද්ධාන්ත) | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 4.2 ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍ය කරුවන් හඳුනා ගනියි. | ■ හෙන්රි ජයසේන, සයිමන් නවගත්තේගම, බන්දුල ජයවර්ධන, සුගතපාල ද සිල්වා, පරාක්‍රම නිරිඇල්ල යන නාට්‍යකරුවන් දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දැක්වූ දායකත්වය පිළිබඳ විමසයි.<br>■ ඔවුන්ගේ වේදිකා නාට්‍ය හා වෙනත් කලා නිර්මාණ පිළිබඳ විස්තර කරයි.<br>■ එම නිර්මාණකරුවන්ගේ නාට්‍ය නැරඹීමට කැමැත්ත ප්‍රකාශ කරයි. | ■ හෙන්රි ජයසේන, සයිමන් නවගත්තේගම, බන්දුල ජයවර්ධන, සුගතපාල ද සිල්වා, පරාක්‍රම නිරිඇල්ල යන නාට්‍යකරුවන් දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දැක්වූ දායකත්වය<br>■ ඔවුන්ගේ වේදිකා නාට්‍ය හා වෙනත් කලා දායකත්වයන් | 4.2.1/ 4.2.2/ 4.2.3 4.2.4/ 4.2.5 දේශීය නාට්‍යකරුවන් හඳුනා ගනිමු. (සිද්ධාන්ත) | 02 |
| සමස්තය | | | | | 13 |